

# හැඳල
# බැප්ටිස්ට් සභාව
# පුවත් හසුන 2023

# Hendala
# Baptist Church
# News Letter 2023



# <u>ගරු දේවගැතිතුමාගේ පණිවිඩය</u>

**ප්‍රේමවන්ත ඇදහිලිවතුනි,**

**එබැවින් මෙපමණ මහත් සාක්ෂිකාර සේනාවකින් අප වටව සිටින නිසා, සියලු බරද පහසුවෙන් අප අසුකරන පාපයද අහක දමා, ඇදහිල්ලේ කර්තෘවරයාද සම්පූර්ණකරන්නාද වූ යේසුස්වහන්සේ දෙසම බලමින්, අප ඉදිරියෙහි තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන් දුවමු.**

**(හෙබ්‍රෙව් 12:1)**

අප සැම තවත් නත්තලක් පසු කර අළුත් අවුරුද්දකට පා තබා තිබෙන මොහොතේ **" යේසුස්වහන්සේ දෙසම බලමින් අප ඉදිරියෙහි තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන්"** දිවීමට යොමු වීම වැදගත්ය. එයට හේතුව ඔබ සහ මම අද ජීවත් වන්නේ උන්වහන්සේගේ කරුණාව කරනකොටගෙනය. 2024 අවුරුද්ද තුල අපට මුහුණ දීමට තිබෙන අභියෝග ගැන අපි නොදන්නා නමුත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙසට පමණක් අවධානය යොමු කිරීම තුළින් මෙම වසර ගත කරන්නට අවශ්‍ය කරන ශක්තිය සහ මගපෙන්වීම ලැබෙනු ඇත.

මන්ද යක්ෂයා අපව ඇදහිල්ලෙන් අහක්කරන පිණිස ක්‍රියා කරන අතර ඒ සඳහා පාවිච්චි කරන උපක්‍රමය වනුයේ යේසුස් වහන්සේ වෙතට යොමු කර තිබෙන අපගේ සිත් අහක් කරන පිණිස ක්‍රියා කිරීමයි. අද අප ජීවත් වන රට තුළ ඇති වී තිබෙන ආර්ථික අර්බුදය හමුවේ අපට මුල්‍යමය වශයෙන් ශක්තිමත් වීමට විවිධ ක්‍රියා මාර්ගයන් වෙතට අපගේ අවධානය යොමු කිරීමට සිදුව ඇත. මෙම ක්‍රියාවන් කොපමණ දුරට දේව වචනයට අනුකූලද කියා සොයා බැලීම වැදගත්ය.

අපගේ කිතුනු ඇදහිල්ල **"යේසුස් වහන්සේ දෙසම බලමින් අප ඉදිරියෙහි තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන් දුවන පිණිස "** උන්වහන්සේ ඔබව මාව කැඳවා තිබෙන බව තේරුම් ගැනීම වැදගත්ය. අභියෝග මධ්‍යයේ ඉවසිල්ලෙන් මෙම ගමන යන්ට තිබෙන අතර මෙම ගමනේ අවසානය අප

සියලු දෙනාට ප්‍රීතිය හමුවන බව දේව වචනය පෙන්වා දෙයි. මෙම ගමන අපට යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසියේ ගමන මතක් කරදෙන අතර, අවසානයේ දෙවියන් වහන්සේගේ දකුණු පස සිටීමට හැකි වන බවද මතක් කරදෙනු ඇත.

2023 වර්ෂය ගැන යේසුස් ක්‍රිස්තුස් වහන්සේට ස්තූති කරමින්, 2024 වර්ෂය තුල උන්වහන්සේ දෙසම බලමින් අප ඉදිරියෙහි තබා තිබෙන දිවීම දුවමු. ඒ සඳහා මෙම නව වර්ෂයේ අපි සියල්ලෝම කැපවෙමු.

ඔබ සියළු දෙනාටම දේව ආශිර්වාදය ලැබේවායි ! ප්‍රර්ථනා කර සිටිමු.

**ශ්‍රියාන් ජයමාන්න**

**දේවගැතිතුමා.**

# Message from Dr. Lalin Fernando
# True spirit of Christmas

2023 Christmas was dawned at a time of uncertainty doom & darkness to most of the Sri Lankan's due to the current situation of our country. How did you celebrate Christmas?

Is it, (a) By enjoying a festive season with commercialized Christmas, getting Merry with Santa Claus, glittering Christmas trees with lights Snow & Reindeer etc.

or

(b) Christmas celebration with sentimental which includes family gatherings, exchanging gifts, traditional Christmas events which gives us temporary happiness with cheerful feelings which will gradually fade away, starting from 26$^{th}$ of December mainly because **" THE TRUE CHRISTMAS SPIRIT"** has not penetrated our hearts lifting up our troubled spirits from bondage to sin, bringing us new hope & joy with Immanuel (God with us) entering our hearts to dispel our fears & darkness to a life of worship and witness to our Savior Jesus Christ everyday starting from Christmas.

This was the experience of shepherds suffering in darkness who heard the Good News of glad tidings ( Luke 2: 9-11) & note their instant response of leaving their earthly possessions & running in haste, finding the Saviour & then spreading the Good News of **TRUE CHRITSMAS SPIRIT ( Luke 2:15-17).**

which changed their Lives & gave a new meaning to their sufferings as a result of Christ entering in to their hearts & spirits.

Let the **“TRUE CHRITSMAS SPIRIT”** with persistent Joy with Jesus Christ take over the temporary Merry Christmas without the Saviour Christ in your Lives starting from this Christmas 2023.

## සභාවේ නමස්කාර මෙහෙයයන්

✧ සෑම ඉරුදිනකම පෙ.ව 9.30 ට නමස්කාර දේව මෙහෙය ආරම්භ වේ.

✧ සෑම මසකම පළමුවන සහ තුන්වන ඉරුදිනයන්හි දේව මෙහෙයෙන් පසු ශුද්ධ සහභාගිකමේ දේව මෙහෙය පැවැත්වේ.

✧ නත්තල් දින සහ මහ සිකුරාදා දින දේව මෙහෙයයන් ආරම්භ වන්නේ පෙ.ව 8.00 ටය.

✧ දෙසැම්බර් මස 31 වන දින රාත්‍රි 11.15 ට වර්ෂ අවසාන දේව මෙහෙය ආරම්භවේ.

## බයිබල් අධ්‍යයනයන්

✧ සෑම ඉරුදිනකම පෙ.ව 8.00 සිට පෙ.ව 9.15 දක්වා දෙව් ආසිරි සෙවන ගොඩනැගිල්ලේ පහත මාලයේ වැඩිහිටියන් සඳහා වූ බයිබල් අධ්‍යයනය පැවැත්වේ.

✧ තරුණයන් සඳහා වූ බයිබල් අධ්‍යයනය පෙ.ව 8.00 සිට පෙ.ව 9.15 දක්වා දෙව් ආසිරි සෙවන ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ පැවැත්වේ.

✧ සෑම මසකම දෙවන ඉරුදින ප.ව 4.00 සිට ප.ව 8.00 දක්වා දෙව් ආසිරි සෙවන ගොඩනැගිල්ලේ බිම් මහලේ අජිත් ක්‍රිස්ටෝපර් මහතාගේ මෙහෙයවීමෙන් බයිබල් අධ්‍යයනයක් පැවැත්වේ.

## යාච්ඤා රැස්වීම්

- ✧ සෑම සිකුරාදා දිනකම ප.ව. 7.00 සිට ප.ව. 8.00 දක්වා ගරු දේවගැතිතුමාගේ මෙහෙයවීමෙන් යාච්ඤා රැස්වීමක් දේවස්ථානයේදී පැවැත්වේ.
- ✧ සෑම මසකම පළමුවන බ්‍රහස්පතින්දා දින ප.ව. 6.00 සිට ප.ව. 7.00 දක්වා කාන්තා සමිතියේ මෙහෙයවීමෙන් යාච්ඤා රැස්වීමක් දේවස්ථානයේදී පැවැත්වේ.

## මිනුවන්ගොඩ පොල්වත්ත එවැන්ජලිස්ත මධ්‍යස්ථානය

2023 වර්ෂය මුළුල්ලේ මෙම මධ්‍යස්ථානයේ දේව මෙහෙයයන් සහ යාච්ඤා රැස්වීම් ඇදහිලිවතුන්ගේ ආත්මික වර්ධනය සඳහා සාර්ථක ලෙස ක්‍රියාත්මක වීම ගැන සර්වබලධාරී දෙවියන්වහන්සේට ස්තූති කරමු.

අප සභා පාලක දේවගැතිතුමාගේ මෙහෙයවීමෙන් සෑම ඉරුදිනකම සවස එම සාමාජිකයින් සමඟ යාච්ඤා රැස්වීමක් පැවැත්වුනි. සෑම මසකම 4 වන ඉරුදින අප දේවගැතිතුමා ඔවුන් නමස්කාරයට සහභාගිවන පොල්වත්ත මෙතෝදිස්ත දේවස්ථානයේ  දේව මෙහෙය භාරව ක්‍රියා කළේය. අප සභාවේ විශේෂ අවස්ථාවන්හීදී එම සමාජික සහෝදරයින් අප සමඟ නමස්කාරයට එක්වීම ගැන සතුටු වෙමු.

2023 වසරේදි අප සභාවේ සහෝදර සමිතියේ සහ කාන්තා සමිතියේ සාමාජික සමාජිකාවන් එම සහෝදර සහෝදරියන් හා සමඟ එක්ව ආත්මික වැඩ සටහන් ක්‍රියාත්මක කළහ.

# සභාව මඟින් ඉටු කරනු ලබන සමාජ සත්කාරක සේවාවන්

## ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම

සුපුරුදු පරිදි 2023 වසරේ ද සතියේ සෑම සෙනසුරාදා දිනකම ප.ව. 4.00 සිට ප.ව. 5.00 දක්වා ප්‍රදේශයේ දරුවන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීමේ වැඩ සටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකිවීම ගැන දෙවියන්වහන්සේට ස්තූති කරමු. නොමිළයේ ඉගැන්වීම කරන මෙම පංතිවලට විවිධ වයස් කාණ්ඩවලට අයත් දරුවන් සියයකට වැඩි ගණනක් සහභාගිවීමත් තව බොහෝ දෙනෙක් ඇතුළත් වීමට බලාපොරොත්තුවෙන් සිටීමත් සතුටට කරුණකි.

වසර අවසානයේ දී එම සිසුන් සඳහා ඔවුන්ගේ දෙමව්පියන්ගේද සහභාගීත්වයෙන් නත්තල් උත්සවයක් සහ විවිධ ප්‍රසංගයක් පැවැත්වුනි. මෙම සත්කාරක සේවය සඳහා තම ශ්‍රමය සහ කාලය යොදවමින් වෙහෙසුන මිහිරන්සි සමරසිංහ මහත්මියගේ සහ ගුරු මණ්ඩලයේ සේවය ගැන දෙවිඳුන්ට ප්‍රශංසා කරමු.

## සාක්ෂරතා පංතිය

පාසල් අධ්‍යාපනය නොලත් සාක්ෂරතාව හීන වූ ප්‍රදේශයේ දරුවන් සඳහා සාක්ෂරතා පංතියක් මේ වසරේදි ආරම්භ කිරීමට හැකිවීම සභාවේ භාග්‍යයකි. ලෝක බයිබල් සමාගමේ සහ ඊට අනුබද්ධ ලංකා බයිබල් සමාගමේ මෙහෙයවීමෙන් පැවැත්වෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අප සභාව තෝරා ගැනීම ගැන දෙවියන්වහන්සේට ස්තූති කරන අතර ශ්‍රී ලංකා බයිබල් සමාගමේ මහ කළමණාකාර ගරු ප්‍රියන්ත විජේගුණවර්ධන දේවගැතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට කෘතඥ වෙමු.

ප්‍රදේශයේ දරුවන් 25 දෙනෙකුගෙන් ආරම්භ වූ මෙම සේවය ඒ සඳහා පුහුණුව ලත් අප සභාවේ සාමාජික ගුරුවරියන් කිහිප දෙනෙකුගෙන් සහ විශේෂ පුහුණුවක් ලැබූ ගුරු මහත්මියක මගින් සාර්ථකව ක්‍රියාත්මක වේ.

සහභාගී වන දරුවන්ගේ සාක්ෂරතාව දියුණු කිරීමේ අරමුණින් ඉගැන්වීම සහ ඉගෙන ගැනීම සඳහා අවශ්‍ය උපකරණ සහ ලිපි ද්‍රව්‍ය ද පෝෂ්‍ය ජනක ආහාර වේලක්ද ශ්‍රී ලංකා බයිබල් සමාගමෙන් සපයනු ලැබේ.

වසර අවසානයේ සහභාගී වූ දරුවන් සඳහා නත්තල් උත්සවයක් පැවැත්වීමට හැකිවීම භාග්‍යයකි.

විවිධ සමාජ පසුබිම්වල හැදී වැඩුන විවිධාකාර සමාජයීය සහ ආර්ථික ගැටලුවලට මුහුණ දුන් සමාජයේ ඇගයීමට ලක් නොවූ දරුවන් එකතු කර **(ඔව් ඔබට පුළුවන්)** " Yes you can" යන්න තේමා පාඨය කරගනිමින් සමාජයට යහපත් පුරවැසියන් බිහිකර දීමේ අරමුණින් වටිනා සේවයක් ඉටු කරන රේණුකා ද සිල්වා මහත්මිය ප්‍රමුඛ ඇදුරු මඩුල්ල ගැන දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමු.

## 2023 වසරේ පැවැත් වූ සභාවේ විශේෂ දේව මෙහෙයයන් සහ විශේෂ අවස්ථා

2023.01.01 - නව වර්ෂයේ ප්‍රථම දේව මෙහෙය ගරු දේවගැතිතුමාගේ මෙහෙයවීමෙන් පවත්වන ලදී.

2023.03.05 - මෙදින දේව මෙහෙයෙන් පසු සභාවේ වාර්ෂික මහා සභා රැස්වීම පවත්වන ලදී. ඉදිරි වසර සඳහා නිලධාරීන් සහ සභා කමිටුවට සාමාජිකයින් තෝරා ගන්නා ලදී.

2023.03.19 - සභාවේ 185 වන සංවත්සර දේව මෙහෙය පැවැත්වින. ගරු ජයනාත් පණ්ඩිතරත්න පියතුමා දේව පණිවිඩය බෙදා දුන්නේය. නව නිලධාරීන් සහ කමිටු සාමාජිකයින් සේවය සඳහා කැප කරන ලදී. මෙදින සභා පවුලේ පින්තූරයක් ගන්නා ලදී.

2023.04.02 - 2023.04.08 දක්වා ශුද්ධ සතියේ වැඩසටහන් ක්‍රියාත්මක විය.

2023.04.02 - තල් අතු ඉරිදා - දේව මෙහෙය
දේශක - ඩිල්රුක්ෂි නානායක්කාර මිය.

2023.04.03 - (ප.ව.7.00 ට ආරම්භ වූ දේව මෙහෙය) - මෙහෙයවීම - තරුණ සමිතිය දේශක - ෂරේන් ද සිල්වා මහතා.

2023.04.04 - දේව මෙහෙය - මෙහෙයවීම - කාන්තා සමිතිය
දේශක - අරුණි ජයතුංග මිය.

2023.04.05 - දේව මෙහෙය - මෙහෙයවීම - සහෝදර සමිතිය
දේශක - රැල්ෆ් සොලමන්ස් මයා.

2023.04.06 - මහ බ්‍රහස්පතින්දා - දේව මෙහෙය
දේශක - ගරු ලූෂන් ඇන්තනී දේවගැතිතුමා

2023.04.07 - මහ සිකුරාදා දින - දේවමෙහෙය
දේශක ගරු ලූෂන් ඇන්තනී දේවගැතිතුමා

2023.04.08 - පෙ.ව 6.30 සිට ප.ව 4.30 දක්වා යාඥා දම්වැල

2023.04.09 - පාස්කු ඉරුදින දේවමෙහෙය
දේශක - ප්‍රසාද් පෙරේරා සහෝදරතුමා

2023.04.30 - මෙදින දේව මෙහෙයෙන් පසු අලුත් අවුරුදු ක්‍රීඩා උත්සවය තරුණ සමිතියේ මෙහෙය වීමෙන් පවත්වන ලදී.

2023.05.01 - ශ්‍රමදානය මෙහෙයවීම - තරුණ සමිතිය

2023.08.20 - අවගාහන දේව මෙහෙය

2023.08.27 - අස්වනු මංගල්‍ය දේව මෙහෙය

2023.11.26 - ඉන්දියාවේ ගාරෝ ප්‍රදේශයේ සිට පැමිණි මිෂනාරී කණ්ඩායම අප දේවමෙහෙයට සහභාගි වීම සහ එදින දේව පණිවිඩය එම කණ්ඩායමේ බිකාශ් ජී නොමින් දේවගැතිතුමා විසින් බෙදා දීම.

2023.12.02 - නොමිලයේ පවත්වන ඉංග්‍රීසි පන්තියට සහභාගී වන සිසුන් සඳහා වූ නත්තල් උත්සවය

2023.12.10 - සියනෑ කලාපයේ සභාවන් හා සමඟ එක්ව පැවැත්වූ නත්තල් කැරොල් දේව මෙහෙය

2023.12.16 - සබත් පාසල් දරුවන් සඳහා වූ නත්තල් උත්සවය

2023.12.25 - නත්තල් දින දේව මෙහෙය

2023.12.31 - වර්ෂාන්ත දේව මෙහෙය

# සභා පවුලේ පුවත්

## අවගාහනයන්

2023.08.20 වන ඉරු දින පැවති දේව මෙහෙයේදී පහත නම් සඳහන් සියලු දෙනා යේසුස් වහන්සේ තම ගැලවුම්කරු ලෙස පිළිගනිමින් අවගාහනය වූහ.

- ✧ මුෂ්මික පැටිකිරිආරච්චි
- ✧ දේවදාස් දොරේෂන්
- ✧ ඩිල්ෂාන් අසෝක කුමාරසිරි
- ✧ මනිෂ්ක ෆොන්සේකා
- ✧ ඉන්සිත් අලහකෝන්
- ✧ අශිනි නිමේෂා උදයංගි
- ✧ දීනා ජයමාන්න
- ✧ මයුමි පෙරේරා

## ළදරු කැපකිරීම්

2023.08.06 - දින ජේසුදාස් නඩරාජා යුවළගේ පුත් සයන් ජෙමුයෙල් ළදරුවා කැප කරන ලදී. සභාව ඉදිරියේ කැප කළාවූ මේ දරුවා ගැන දෙවි පියාණන්ට තුති පුදමු.

## දරු උපත්

2023.07.06 - දින රුක්ෂාන් සහ නදුලි ගල්ගොඩපිටිය යුවළට පුතෙක් - යුවෙන් සහිරු ගල්ගොඩපිටිය.

2023.10.25 - දුලාංජන් සහ හෂිනි ද අල්විස් යුවළට දියණියක් - කියාරා මියුකි ද අල්විස්

අලුත උපන් දරු දෙදෙනාට දේව ආශිර්වාද පතමු.

## විවාහ මංගල්‍යයන්

2023.07.23 - දින සභා සාමාජික දිලීප ප්‍රනාන්දු තරුණ මහතා ගර්ටි ද සිල්වා මෙනෙවිය සමඟ බොරලැස්ලේ ශාන්ත ලූක් දේවස්ථානයේදී යුග දිවියට ඇතුළත් විය.

2023.09.28 - දින සභා සාමාජික ලිනාරා ද අල්විස් මෙනෙවිය පුබුදු බොතේජු තරුණ මහතා සමඟ නායකකන්ද ශාන්ත මරියා දේවස්ථානයේදී යුග දිවියට ඇතුළත් විය.

යුග දිවියට ඇතුළත් වූ දෙපළට දේව ආශිර්වාද ලත් යුග දිවියක් පතමු.

## විශේෂ උපන්දින සැමරුම්

2023.07.04 - දින සභා සාමාජික ඩෝරා විජේසිංහ සහෝදරියගේ 90 වන ජන්ම දිනය සිහිපත් කරමින් විශේෂ ස්තූති දීමේ දේව මෙහෙයක් පවත්වන ලදී. ඇයට ලැබුණු දේව ආශිර්වාද ගැන සභාවේ සතුට ප්‍රකාශ කරමු.

## ස්වර්ගස්ථ වීම්

2023.01.01 - රාසයියා මුරුගයියා මහතා - සභා සාමාජික තනූෂා මාරිමුත්තු මහත්මියගේ පියා

2023.01.22 - ක්ලැරන්ස් ද අල්විස් මහතා - සභා සාමාජික චතුරංග සේනාරත්න මහතාගේ බිරිඳගේ පියා

2023.05.01 - එස්.හේරත් මහත්මිය - සභා සාමාජික රංජිත් සුදසිංහ මහතාගේ මව

2023.08.25 - ආර්.පී.සමරසිංහ මහතා - සභා සාමාජික උපේකා සමරසිංහ (විජේසිංහ) මහත්මියගේ ස්වාමිපුරුෂයාගේ පියා

2023.09.13 - සභා සාමාජික ඒමලි කෝල්ටන් මිය

2023.11.12 - සභා සාමාජික සරත් ද අල්විස් මහතා

ඉහත වියෝවීම් නිසා ශෝකයට පත් සියල්ලන් වෙත සභාවේ කණගාටුව ප්‍රකාශ කරමු.

## විභාග සමත්වීම් සහ වෙනත් ජයග්‍රහණයන්

1) දීනා ජයමාන්න ශිෂ්‍යයාව 2023 වර්ෂයේ පැවැති අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් උසස් ලෙස සමත් වූවාය.
2) අමශ්කි සමරසිංහ ශිෂ්‍යයාව ජාත්‍යන්තර උසස් පෙළ -Edexcel - Maths විභාගය (A සාමාර්ථ තුනක් සහිතව) විශිෂ්ඨ ලෙස සමත් වූවාය.
3) අමාශා සමරසිංහ නීතිඥ (L.L.B) විභාගයත් කථන සහ නාට්‍ය පිළිබඳ වෙන්ඩි වට්මෝර් ආයතනයේ ගුරු ඩිප්ලෝමා පාඨමාලාවත් (A.W.W.A) හදාරා සමත් වූවාය.
4) වෛද්‍ය විකුම් සුදසිංහ මහතා විශ්ව විද්‍යාලයේ පශ්චාත් වෛද්‍ය විද්‍යායතනයේ ජෛව වෛද්‍ය තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සමත් විය.
5) තිළිණි ගල්ගොඩපිටිය (සුදසිංහ) මහත්මිය නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය පන්ති සාමාර්ථයක් සහිතව සමත් වී මාස හයක ආධුනිකත්ව පුහුණුව ලබමින් සිටින්නීය.
6) ඩිල්හාන් අශෝක කුමාරසිරි (මිනුවන්ගොඩ එවැන්ජලිස්ත මධ්‍යස්ථානයේ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇත.
7) විදුල වනිගසේකර ලන්ඩනයේ සහතිකලත් වරලත් ගණකාධිකාරී ආයතනයේ අනුබද්ධ සාමාජිකත්වය ( A.C.C.A - UK Afflicted Member ) ලබා ඇත.
8) සෙනලි පනංගල වරලත් මානව සම්පත් කළමනාකාර පාඨමාලාව හදාරා ඉන් සමත්ව ඇත.
9) ෂෙනුක් විජේසිංහ මේ වසර තුළ ජයග්‍රහණයන් කිහිපයක් හිමි කර ගත්තේය,

- ✧ 2023 වර්ෂයේ ඉන්දුනීසියාවේ බාලි නගරයේ පැවැති ජාත්‍යන්තර ගායකයන් පිළිබඳ වූ තරඟයේ ඒක පුද්ගල ගායනය සඳහා ජයග්‍රාහකයා බවට පත්ව ඒ සඳහා වූ රන් පදක්කම ලබා ගත්තේය.
- ✧ කථන සහ නාට්‍ය පිළිබඳ වෙන්ඩි වට්මෝර් ආයතනයේ ගුරු ඩිප්ලෝමා පාඨමාලාව (A.W.W.A) හැදෑරීම සහ ඉන් සමත්වීම සහ එම ආයතනයේ හොඳම නළුවාට (Actor) හිමි සම්මානය ලබා ගැනීම.
- ✧ ලන්ඩන් රාජකීය සංගීත ආයතනයේ (Royal Schools of Music) ගායනය සඳහා වූ ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම.(A.R.S.M)
- ✧ 2023 දී කාන්තා කළමණාකාරිත්වය සහ ජාතික තරුණ සභාව 04 වන වතාවට සංවිධානය කළ නව පරපුරේ සම්මාන උත්සවයේ කලා හා සංස්කෘතිය පිළිබඳ සම්මානය හිමිකර ගැනීම.

ඉහත ජයග්‍රහණයන් සහ විභාග සමත්වීම් ගැන සභාවේ සතුට ප්‍රකාශ කරන අතර ඔවුන් සියලු දෙනාටම දේවාශීර්වාද පිරි අනාගතයක් පතමු.

# අනු අංශ පුවත්

## ඉරු දින දහම් පාසල

2023.01.15 වන දින මෙම වර්ෂය සඳහා සබත් පාසල් ඉගැන්වීමේ කටයුතු ආරම්භ කිරීමට ලැබීම ගැන දෙවියන්වහන්සේට ස්තූති කරමු. බැප්ටිස්ට් සබත් පාසල් කමිටුව මඟින් පැවැත්වූ ගුරු පුහුණුවට අප සබත් පාසල් ගුරුවර ගුරුවරියන්ද සහභාගි විය.

අප සබත් පාසලේ දරුවන් 34 දෙනෙකු සිටින අතර ගුරුවර ගුරුවරියන් 11 දෙනෙකුගේ මග පෙන්වීම යටතේ දරුවන් දෙවියන්වහන්සේ වෙත ළඟා කරවීමේ මහඟු කාර්යය මේ වසරේද මනාව ඉටුවිය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය අන්‍යයන් අතර බෙදා ගැනීමට දරුවන් යොමු කිරීම අපගේ ප්‍රධාන අරමුණ විය.

අගෝස්තු මස 12 වන දින මහනුවර ප්‍රදේශය බලා ගිය විනෝද චාරිකාව දරුවන්ට මහත් ආශිර්වාදමත් ගමනක් විය. ත්‍රිත්ව විශ්ව විද්‍යාලයේ දේවස්ථානය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, හන්තාන කුරුළු උයන, ගන්නෝරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඔවුන් නැරඹූ ස්ථාන වූ අතර එය අධ්‍යාපනික වශයෙන්ද දරුවන්ට ප්‍රයෝජනයක් විය. අප සමඟ නමස්කාරයට සහභාගී වූ දැනට ඇමරිකා එක්සත් ජනපදයේ පදිංචි බීනා අමාන් සහෝදරිය සහ එම දරුවන් මෙම චාරිකාව සඳහා සියලු වියදම් දැරීම ගැන ඔවුන්ට අපගේ ස්තූතිය පුද කරමු. ඔවුනට දේවාශිර්වාද පතමු.

2023 වර්ෂයේ සබත් පාසල් කඳවුර මුන්දලම''කමත''කඳවුර මධ්‍යස්ථානයේ සැප්තැම්බර් මස 28 වන දින සිට 30 වන දින දක්වා පවත්වන ලද අතර අප සබත් පාසල් දරුවන් 18 දෙනෙකු සහ ගුරුවරියන් දෙදෙනෙක් ඊට සහභාගී විය.දරුවන් ඒ සඳහා සහභාගී කරවීමට උනන්දු වූ සියලුම දෙමාපියන්ට අප සබත් පාසලේ ස්තූතිය පුදකර සිටින අතර ඊළඟ වර්ෂයේ පවත්වන කඳවුර සඳහා අප සබත් පාසලේ සියලුම දරුවන්ට සහභාගි වීමට මග පෙන්වන මෙන් දෙමාපියන්ගෙන් ඉල්ලා සිටිමි.

ලෝක ළමා දින සැමරීම වෙනුවෙන් මෙවර ඔක්තෝබර් මස අටවන ඉරු දින සබත් පාසල් දරුවන්ගේ ඉරු දින ලෙස වෙන්කර තිබූ අතර එදින අප සභාවේ දේව මෙහෙය භාරව කටයුතු කළේ සබත් පාසල් දරුවන්ය. කොළඹ කාන්තා විදුහලේ ශිෂ්‍යා ගල්කිස්ස ක්‍රිස්තු දේව සභාවේ ළමා සේවයේ යෙදී සිටින හිරණ්‍යා ප්‍රනාන්දු දියණිය එදින දේව පණිවිඩය බෙදා දුන්නාය.

මෙම වර්ෂයේ ද පාසල් පැවැත්වීමේ කාලයේත් විභාග පැවැත්වීමේ කාලයේත් සිදු වූ වෙනස දරුවන්ට මානසිකව බලපෑවත් අප ගුරුවරුන් එම අභියෝගය ජය ගැනීම සඳහා අවශ්‍ය මානසිකත්වය දරුවන් තුළ ඇති කරමින් ඉටු කළ සේවාව අගය කළ යුතුය. පසුගිය වර්ෂයේ පැවති සබත් පාසල් විභාගයේ ප්‍රතිඵල අනුව අප දරුවන් විශිෂ්ඨ ලෙස සමත් වූ බව පවසන්නේ ඉමහත් සතුටිනි.

සබත් පාසල් විභාගයට පෙනී සිටීමෙන් අනතුරුව අපි සියලු දෙනා එක්ව නත්තල් වැඩසටහන් සඳහා සූදානම් වීමු. පන්ති  මට්ටමින් දරුවන්ගේ දක්ෂතා එළි දැක්වුන අතර දේව වචනය අනුවම යමින් "සැබෑ නත්තල" නමින් නත්තල් නාට්‍යයක් සියලුම දරුවන්ගේ සහභාගීත්වයෙන් රඟ දක්වන ලදි. අප සබත් පාසලේ නත්තල් වැඩසටහන සඳහා මිනුවන්ගොඩ මිෂන් මධ්‍යස්ථානයේ දරු දැරියන්ගේ සහභාගිත්වයත් ඔවුන් සතු තලෙන්ත එළිදැවීමත් ගැන සතුටු වෙමු.

අප සබත් පාසල් දරුවන් වෙත මෙම වර්ෂයේ දී දේවාශිර්වාද මහත් ලෙස ගලා ආ අතර ඔවුන්ට ඉතා වටිනා නත්තල් ත්‍යාගයක්  ලබාදීමට හැකිවීම ගැන දෙවිඳුන්ට ප්‍රශංසා කරමු.

මෙම වර්ෂයේ සබත් පාසලේ කාර්යයන් ඉටු කිරීමට උනන්දුවෙන් සබත් පාසලට සහභාගී වූ සියලුම දරුවන් ගැන දෙවිඳුන්ට ස්තූති කරන අතර දරුවන් ඒ සඳහා යොමු කළ දෙමාපියන්ටද කැපවීමෙන් සේවය කළ ගුරු මණ්ඩලයටද සහාවේ ස්තුතිය පුද කරමු.

2024.01.21 වන දින  නැවතත් සබත් පාසල ආරම්භ වන බව දරුවන් වෙත ආදරයෙන් දන්වා සිටිමු.

ඔබ සැමට දේවාශිර්වාද සපිරි සුභ නව වසරක් වේවා! .

**ශ්‍යාමා ජයමාන්න**

**කළමණාකාරතුමිය**

## කාන්තා සමිතිය

2023 වර්ෂය තුළ දේව රාජ්‍යයේ වර්ධනය සඳහා අප සමිතියේ ක්‍රියාකාරිත්වයන් සහ වැඩසටහන් මෙහෙයවීමට ලැබීම ගැන පළමුව දෙවියන්වහන්සේටත් අපට මග පෙන්වූ ගරු දේවගැතිතුමා ඇතුළු සියලු දෙනාටත් ස්තුති කරමු.

නව වසර සඳහා තේරී පත්වූ නව කමිටුවේ ප්‍රථම කාර්යය වූයේ ශුද්ධ සතියේ දෙවන දින දේව මෙහෙය මෙහෙයවීමයි. එදින දේව පණිවිඩය බෙදා ගැනීම සඳහා අප ආරාධනයෙන් සහභාගී වූ අරුණි ජයතුංග සහෝදරියට ස්තුති කරමු.

ශ්‍රී ලංකා බැප්ටිස්ට් කාන්තා මව් සමිතියේ මෙහෙයවීමෙන් පවත්වන කාන්තා ඉරුදින දේව මෙහෙයයන්හි දේව පණිවිඩය බෙදා දීමට අප කාන්තාවෝ කිහිප දෙනෙක් වෙනත් සභාවන්ට ගියහ. මට්ටක්කුලිය බැප්ටිස්ට් සභාවේ කමන්ති ශානිකා සහෝදරිය අප සභාවේ දේව පණිවිඩය බෙදා දුන්නාය.

මේ වසර තුළ සෑම මසකම පළමු වන බ්‍රහස්පතින්දා දින සවස 6.00 සිට 7.00 දක්වා දේවස්ථානයට පැමිණ යාඥා කාලයක් පැවැත්වීමට හැකිවීම ගැන දෙවියන් වහන්සේට ස්තුති කරමු.

2023.04.22 දින සාමාජිකාවන් අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් සාර්ථක සුහද සැඳෑවක් පවත්වා ගැනීමට හැකිවීම භාග්‍යයකි. අප සභා පවුලට අයත් වයස්ගතව රෝගාතුරව සිටින අප සහෝදරියන් බැහැ දැකීමත් ඔවුන් සමඟ යාඥාවෙන් සුහද කාලයක් ගත කිරීමත් මෙම වසර තුළ අප දියත් කළ සාර්ථක වැඩසටහනකි.

කාන්තා සමිති වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා ඔක්තෝබර් මස 15 වන දින පැවැත්වූ පොළ අපගේ අරමුණ සාර්ථක කිරීමට සමත් විය. අප සභාවේ කටයුතුවලදී කාන්තා සමිතිය නොපැකිළිවම උදව් වූ බව පවසමු. සභාවේ සමාජ සේවා ව්‍යාපෘතියක් වූ ඉංග්‍රීසි ඉගැන්වීමේ පන්තිවලට

සහභාගීවන දරුවන්ගේ මව්වරුන් සඳහා ශුභාරංචි මෙහෙයක් පැවැත්වීමට හැකිවූ බව සතුටින් සඳහන් කරමු.

නත්තල් උත්සවය වෙනුවෙන් ජයසිංහ විශ්‍රාමික නිවසේ වෙසෙන විශ්‍රාමික කාන්තාවන් සඳහා උත්සවයක් පැවැත්වීමට හැකිවීම ගැන දෙවිඳුන්ට ස්තුති කරමු.

මෙම වසර තුළ අප සමිතිය වෙනුවෙන් මා හැඟි සේවාවක් ඉටුකළ අප සභාපතිතුමිය ඇතුළු කමිටු සාමාජිකාවන්ටත්, අනුශාසකතුමියටත් ස්තුති කරමු.

**සුරංගි ෆැන්සිස්කෝ**
**ලේකම්**
**කාන්තා සමිතිය**

## <u>තරුණ සමිතිය</u>

**"**මිදිවැල මමය. ඔබ අතුය. යමෙක් මා තුළ සිටින්නේද මම ඔහු තුළ සිටිම්ද ඒ තැනැත්තේ බොහෝ ඵල දරයි. මන්ද මාගෙන් වෙන්ව කිසිවක් කරන්නට නොහැකිය**"**

**ශු.යොහාන් 15:5**

යේසුස් වහන්සේගේ ඉහත වදන් සනාථ කරමින් 2023 වසර තරුණ සමිතිය අභියෝගයන් ජයගත් ආශිර්වාදාත්මක වසරක් ගත කළ බව සතුටින් සඳහන් කරමු.

2023.02.11වන දින "Life through prayer" යන්න තේමාව කර ගනිමින් සංවිධානය කළ වැඩමුළුවකින් වර්ෂයේ වැඩ ආරම්භ කළෙමු. මෙදින ගරු ටිරෝන් දේවගැතිතුමා තුළින් අප ලැබූ දේව පණිවිඩය අප ජීවිත වලට ආත්මික ආශිර්වාදයක් විය. දේශනයෙන් පසු අප සභාවේ තරුණ තරුණියන් අතර එකමුතුකම වඩා තහවුරු කිරීමේ අපේක්ෂාවෙන් පැවැත්වූ ක්‍රීඩා කාලයකින් එදින වැඩ අවසන් විය.

සෑම ඉරු දිනකම ප්‍රශංසා කාලය මෙහෙයවීම තරුණ සමිති සාමාජික සාමාජිකාවන්ගේ සහභාගිත්වයෙන් ඉටුවිය. 2023.03.12 වන දින මව් සමිතියේ මෙහෙයවීමෙන් පැවැති බැප්ටිස්ට් තරුණ ඉරුදින දේව මෙහෙය අප තරුණ තරුණියන් විසින් මෙහෙයවන ලද අතර අපේම සාමාජිකාවක වූ ගිම්හානි විජේසිංහ සොයුරිය දේව පණිවිඩය බෙදා දුන්නාය. ශුද්ධ සතියේ සඳුදා දින දේව මෙහෙය තරුණ සමිතිය විසින් මෙහෙයවන ලද අතර එදින දේශනය පවත්වන ලද්දේ අප සාමාජික ශරේන් ද සිල්වා සහෝදරයා විසිනි.

වසර කිහිපයකට නොපැවැත් වූ අවුරුදු ක්‍රීඩා උත්සවය සංවිධානය කිරීමටත් සභාවේ සියලු දෙනාගේ සහභාගීත්වයෙන් එය පැවැත්වීමටත් හැකිවීම ගැන දෙවියන් වහන්සේට ස්තුති කරමු. මැයි පළමු වන දින පැවැත්වූ ශ්‍රමදානයටද තරුණ අපි සහභාගි වුනෙමු.

2023.08.20 වන දින නැවතත් සුහද එකමුතුකමේ කාලයක් ගත කළෙමු. ප්‍රශංසා කාලයකින් ඇරඹී මෙම හමුව වෛද්‍ය විකුම් සුදසිංහ සහෝදරයා බෙදා දුන් දේව පණිවිඩය තුළින් තරුණ සිත් ආත්මිකව පෝෂණය කිරීමේ සමත් විය. වසර කිහිපයකට පසු නැවත වතාවක් අගස්ඵල දේව මෙහෙය පැවැත්වීමට හැකිවීම ගැන දෙවිඳුන්ට ස්තුති කරමු.

සභාවේ අනු අංශයන්හි වැඩසටහන් වලට සහයෝගය දක්වමින් සහභාගි වීමට අප තරුණ සමිතියට හැකි විය. සභාවේ සහෝදර සමිතිය සංවිධානය කළ විවාහක යුවළ සඳහා වූ වැඩමුළුව පැවැති අවස්ථාවේ ඔවුන්ගේ දරුවන් සඳහා වැඩසටහනක් සංවිධානය කිරීම එවැනි අවස්ථාවකි.

ශ්‍රී ලංකා බැප්ටිස්ට් තරුණ සංගමයේ ක්‍රියාකාරකම් වලට සහභාගි වීමට අපට හැකි විය. ශ්‍රී ලංකා බැප්ටිස්ට් තරුණ ඉරුදින දේව මෙහෙය භාරව ක්‍රියා කිරීම මව් සමිතිය සංවිධානය කළ කඳවුරට සහ එක් දින වැඩ මුළුවට සහභාගි වීම ඉන් සමහරකි. මව් සමිති කමිටුවට තේරී පත්වූ අශේන් විජේසිංහට සහ ගිම්හානි විජේසිංහට සුබ පතමු.

2023 වසර තුළ අපට මග පෙන්වූ අප දේවගැතිතුමාට සභාවේ නිලධාරීන් ඇතුළු කමිටුවටත් සහා පවුලටත් ස්තුති කරමු.

**නවිදි වනිගසේකර**
**ලේකම්**

## <u>සහෝදර සමිතිය</u>

විශේෂයෙන්ම සභාවේ සහෝදරයන් තුළ ආත්මික වර්ධනය සහ එකමුතුකම වර්ධනය කෙරෙන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් 2023 වසරේ ශුද්ධ සතියේ බදාදා දින දේව මෙහෙය භාරව ක්‍රියාකරමින් අපගේ වාර්ෂික වැඩසටහන ආරම්භ කළෙමු. මෙදින දේශකයා වූයේ රැල්ෆ් සොලමන්ස් සහෝදරයාය.
සැම සිකුරාදා දිනකම සවස දේවස්ථානයේ පවත්වන යාඥා කාලයට සහභාගී වීම අපගේ මූලික කාර්යයක් වී ඇත. මෙහිදී යාඥාව තුළින් අපගේ කිතුනු ඇදහිල්ල වඩාත් වර්ධනය කර ගැනීමට බලාපොරොත්තු වෙමු.

රෝගීන් සහ පීඩාවට පත්වූවන් බැලීමට යමින් ඔවුන් යාඥාවෙන් දෙවියන්වහන්සේ වෙත වඩා සමීප කරමින් කටයුතු කිරීමට හැකිවීම ගැන ද දෙවියන්වහන්සේට ස්තුති කරමු.

2023.07.30 දින මිනුවන්ගොඩ එවැන්ජලිස්ත මධ්‍යස්ථානයේ සහෝදරයන් සමඟ අප සාමාජිකයින් පැවැත්වූ සුහද හමුව ඉතා සාර්ථක ප්‍රතිඵල අත්කර දුන් බව පවසන්නේ සතුටිනි.

මැයි මාසයේ පෝය දින පෙරවරු 8.30 සිට පස්වරු 1.00 දක්වා නිරාහාර යාඥා කාලයක් පැවැත්වීමට අපට හැකි විය.

පසුගිය වසර මෙන් මේ වසරේද විවාහක පවුල් සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපට හැකි වීම ගැන දෙවියන් වහන්සේට ස්තුති කරමු. ගරු දේවගැති පෝල් ඇලෙක්සර් සහ විල්මා ඇලෙක්සැන්ඩර් මෙහෙයවූ මෙම වැඩසටහන එයට සහභාගී වූ අඹුසැමි යුවළවල් 40 කට පමණ මහත් ආශිර්වාදයක් වූවාට සැක නැත. මෙදින සහභාගී වූ සැමට දිවා ආහාරයෙන්

සංග්‍රහ කිරීමට හැකිවීම ගැන සතුටු වෙමු. මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා සහභාගි වූ දෙමාපියන්ගේ දරුවන් වෙනුවෙන් වැඩසටහනක් සංවිධානය කිරීම ගැන අප සභාවේ තරුණ සමිතියට අපගේ ස්තුතිය පුද කරමු.

ශ්‍රී ලංකා බැප්ටිස්ට් සහෝදරත්වය සංවිධානය කළ ඉරුදින දේව මෙහෙය භාරව ක්‍රියා කිරීමට ලැබීම ගැන සතුටු වෙමු.

සහෝදර සමිති ක්‍රියාකාරකම් ඉටු කිරීමේදී අපට මග පෙන් වූ දෙවි පියාණන්ට ස්තුති කරමු. අවශ්‍ය උපදෙස් දෙමින් අපට සහය වූ ගරු දේවගැතිතුමන්ට සහ සහෝදර සමිති කමිටු සාමාජිකයින්ට අපගේ ස්තුතියි හිමිවේ.

**දිනේෂ් කුමාර්**
**ලේකම්**

## <u>ජයසිංහ විශ්‍රාමික නිවස</u>

2023.01.29 වන ඉරු දින වසර 30 ක දිගු ගමනක් සිහිපත් කරමින් අප දේවස්ථානයේ පැවති විශේෂ ස්තුති දීමේ දේවමෙහෙයකින් ජයසිංහ විශ්‍රාමික නිවසේ නව වසරේ කාර්යයන් ඇරඹුණි.

මේ වසර මුලදී කාමර සියල්ලම නිවසියන්ගෙන් පිරී තිබුණ ද වසර අවසානය වන විට කාමර 5ක් හිස්විය. එනමුදු නිවසේ පැවැත්ම බාධාවකින් තොරව පවත්වාගෙන යෑමට හැකිවීම ගැන දෙවියන්වහන්සේට තුති පුදමු.

ඔක්තෝබර් මාසයේ නිවසේ පදිංචිය සඳහා පැමිණි කේ. පුවනේස්වරී සහෝදරිය ආදරයෙන් පිළිගත්තෙමු. කොරෝනා වසංගත තත්ත්වයෙන් පසුව දිනපතා යාඥාව පැවැත්වීම නිවැසියන්ගේ සහභාගිත්වයෙන් පමණක් ඉටු වූ අතර මේ වසරේදීද එය එසේම ක්‍රියාත්මක විය. සතියේ එක් දිනක් යාඥාව මෙහෙයවීම සඳහා ගරු ජැනට් ටැම් දේවගැතිතුමියගේ පැමිණීම අගය කරමු.

හොංකොං සිට මෙහි පැමිණි ෆ්‍රිඩා වොන් මිෂනාරීවරිය සැප්තැම්බර් මාසයෙන් පසුව සේවා ස්ථාන මාරුවක් ලබා රත්නපුරයට යෑම ගැන කණගාටු වෙමු.

වසර නවයක් මුළුල්ලේ ජයසිංහ විශ්‍රාමික නිවසේ සේවයෙහි යෙදී සිටි ලලනි පද්මපෙරුම මහත්මිය රෝගාතුර වීම නිසා මැයි මාසයේදී අපෙන් සමු ගත්තාය. ශාජිනි මහත්මිය එම සේවය සඳහා අගෝස්තු මස සිට පැමිණියාය.

අප රට මුහුණ දුන් ආර්ථික පරිහානි තත්ත්වය ජයසිංහ විශ්‍රාමික නිවසේ යහ පැවැත්මට බාධාවක් වුවත් ඒ අභියෝගය ජයග්‍රහණය කිරීමට අපට හැකිවීම දේවාශිර්වාදයක් සේ සලකමු. මේ අවස්ථාවේ අපට ශක්තියක් වූ අප සභාවටත් පරිත්‍යාගශීලීන්ටත් ස්තුති කරමු.

තව ද වැඩි වූ විදුලි බිල ගෙවීමේ කාර්යයට මුහුණදීම සඳහා සූර්ය බල ශක්ති පද්ධතියක් පිහිටුවීම සඳහා අරමුදලක් ආරම්භ කළෙමු. ඒ සඳහා දැනට පරිත්‍යාග ලබා දුන් එස්. කන්දයියා යුවළටත් ගරු ජනට් ටැම් දේවගැතිතුමියටත් ස්තුති කරමු. මේ සඳහා අප සභාවෙන් ඉටුකිරීමට අදහස් කරන සේවයටද ස්තුති කරමු.

මේ වර්ෂයේදී ද රෝගීන්ගේ පහසුව සඳහා අප සතුව ඇති උපකරණ අප සභාවේ සහ වෙනත් සභාවන්හි රෝගීන්ගේ පාවිච්චිය සඳහා දීමට හැකිවීම අප ලැබූ ආශිර්වාදයක් සේ සලකමු. මෙවර නත්තල් ප්‍රීතිය බෙදා ගැනීම සඳහා නිවැසියන්ට තෑගි රැගෙන පැමිණි නුගේගොඩ කාන්තා සමිති කාන්තාවන්ටත් අප සභාවේ කාන්තා සමිති කමිටුවටත් ස්තුති කරමු.

2023 වසර තුළ ජයසිංහ විශ්‍රාමික නිවසේ පැවැත්ම සඳහා අවශ්‍ය උපදෙස් දෙමින් මග පෙන්වූ ගරු ශ්‍රියාන් ජයමාන්න දේවගැතිතුමාටත් ගරු ජෝසප් අන්ද්‍රදි දේවගැතිතුමාටත් අපගේ කෘතඥතාවය පුද කරමු. මෙහිදී අප දේවගැතිතුමාගේ බිරිඳ ලෙස ශ්‍යාමා ජයමාන්න මහත්මියගෙන් ඉටු වූ සේවය අගයන බව දන්වමු.

නන් අයුරින් සහය වූ අප සභාවේ නිලධාරීන් ඇතුළු සභා කමිටුවටත් සභා සාමාජිකයින්ටත් ස්තුති කරන අතර ජයසිංහ විශ්‍රාමික නිවාස කමිටුවේ සාමාජික සාමාජිකාවන්ගේ සේවය අගයන බව දන්වමු.

**ස්වර්ණා එගොඩමහවත්ත**
**ලේකම්**

## Internet Ministry - අන්තර්ජාලය මගින් ශුභාරංචි සේවය

බැප්ටිස්ට් ශ්‍රී ලංකා වෙබ් අඩවිය 2017 වසරේදී හැදල බැප්ටිස්ට් සභාව වෙනුවෙන් මා විසින් නිර්මාණය කර ස්ථාපනය කරන ලද්දකි. ඒ සඳහා සබැඳි ෆේස්බුක් (Facebook) පිටුවද සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. Facebook පිටුව සඳහා පමණක් 2023 දෙසැම්බර් මස සඳහා යාවත්කාලීන කිරීම් 67 ක් සිදුකර ඇත.

ඉහත සඳහන් කළ පිටුවට සමාන්තරව එවැනිම වෙනත් මාධ්‍යයක් වන Instergram හරහා බැප්ටිස්ට් ශ්‍රී ලංකා ලෙස නව පිටුවක් 2023 වසරේදී ආරම්භ කරන ලදී. මෙම පිටුව හරහා ශ්‍රී ලංකාවේ අප සභාවන් පිළිබඳ තොරතුරු සමඟ ශුභාරංචි බෙදා දෙන අතර ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාව, ඉන්දියාව, පිලිපීනය, එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, එක්සත් එමීර් රාජ්‍ය, එක්සත් රාජධානිය, මැලේසියාව, කැනඩාව, බංගලාදේශය යන රටවලින් මෙම තොරතුරු සඳහා වැඩි ඉල්ලුමක් ඇති බව සංඛ්‍යා ලේඛන පෙන්වා දෙයි.

අප කැරොල් කණ්ඩායම විසින් ගායනා කරන ලද " The Drummer Boy " නමැති කැරොල් ගීතය දින දෙකක් තුළදී දහස් වතාවක් අන්තර්ජාලය හරහා නැරඹූ බව සඳහන් කරන්නේ ප්‍රීතියෙනි. ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමයේ තාක්ෂණික කමිටු නිලධාරීන් ඉහත සඳහන් වෙබ් අඩවියෙහි පූර්ණ අයිතිය ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමයට ලබාදෙන ලෙස වාචික ඉල්ලීමක් සිදුකර ඇත.

නව අංගයන් සහ පහසුකම් සහිතව නවීකරණය කරන ලද මෙම වෙබ් අඩවිය දැන් භාවිතා කළ හැක. ඒ හරහා ඔබට මෙම පුවත් හසුන බාගත කළ හැක.

2017 වසරේ දී මෙම වෙබ් අඩවිය නිර්මාණය කිරීමේදී එය ආරම්භ කිරීමට දුන් ශක්තිය සහ මග පෙන්වීම ගැන අප සභා පාලක ගරු ශ්‍රියාන් ජයමාන්න දේවගැතිතුමාට ස්තුති කරමි.

සියලු ගෞරවය සහ ප්‍රශංසාව දෙවි පියාණන්ටම වේවා!

**උපාලි ද අල්විස්**
**වෙබ් අඩවි ව්‍යාපෘති භාරකරු**

## දෙව් ආසිරි සෙවන

හැඳල බැප්ටිස්ට් සභාව විසින් ඉටු කෙරෙන ආත්මික, සමාජයීය, ආර්ථික සහ පෞරුෂ වර්ධන ක්‍රියාකාරීත්වයන් දෙව් ආසිරි සෙවන ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගනිමින් ඉටුවිය. මෙම සත්කාරක සේවාවන් නොයෙක් ආකාරයෙන් අප සභාවේ අනු අංශ වත්තල “ලෝක දර්ශන” ආයතනය සහ ශ්‍රී ලංකා බයිබල් සමාගම තුළින් ඉටුවේ.

2023 වසර තුළ සභාවේ අනු අංශ නොයෙකුත් වැඩසටහන් සංවිධානය කළ අතර වත්තල “ලෝක දර්ශන” (World Vision) ආයතනය පහසුකම් සපයන්නෙකු විය. 2023 අප්‍රේල් මස සිට වසර අවසානය දක්වා ශ්‍රී ලංකා බයිබල් සමාගමේ අනුග්‍රහයෙන් සාක්ෂරතා පන්තියක් (Literacy Class) පැවැත්වීම ආරම්භ වීම විශේෂ සේවාවකි.

වසර කිහිපයක් මුළුල්ලේ සිට පවත්වාගෙන යන නොමිලයේ ඉංග්‍රීසි ඉගැන්වීමේ පංතියද 2023 වසරේ සාර්ථකව ක්‍රියාත්මක විය. මිහිරන්සි සමරසිංහ සහෝදරියගේ කළමනාකාරිත්වයෙන් සහ ස්වේච්ඡාවෙන් සේවය කරන ගුරු මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය නිසා ඉංග්‍රීසි පන්තිය සීඝ්‍රයෙන් වර්ධනය වූ අතර සහභාගී වන සිසුන් තම ඉංග්‍රීසි භාෂා දැනුම

වර්ධනය කර ගැනීමේ අරමුණින් ඊට සහභාගී වීම දක්නට ලැබුණි. මෙවර නත්තල වෙනුවෙන් විවිධ ප්‍රසංගයක් සහිත උත්සවයක් පැවති අතර ළමුන් 120 කට ආසන්න ප්‍රමාණයකට වටිනා ත්‍යාග ලබාදීමට හැකිවීම ගැන දෙවියන්වහන්සේට තුති පුදමු. එම කාර්යය සඵල කර ගැනීමට පරිත්‍යාග පිරි නමමින් සහය දුන් පරිත්‍යාගශීලීන්ට අපගේ ස්තූතිය පුද කරමු.

මේ වසරේ ආරම්භ කළ සාක්ෂරතා පන්තියේ ඉගැන්වීමේ කටයුතුද සාර්ථකව ඉටුවේ. රේණුකාද සිල්වා මහත්මියගේ මූලිකත්වයෙන් සහ ස්වේච්ඡාවෙන් උගන්වන ගුරු මහත්මීන්ගෙන් සේවය ලබන මෙම පන්තියේ සිසුන් 25 දෙනෙක් ඉගෙනුම ලබති."Yes You Can" “ඔව් ඔබට පුළුවන්” යන තේමා පාඨය මුල් කරගත් මෙම සේවයේ අරමුණ පාසල් නොගිය දරුවන් තුළ කියවීමේ හැකියාව ලබාදීමයි. ඔවුන් වෙනුවෙන් නත්තල් උත්සවයක් ද පවත්වන ලදී.

2023 වසර තුළ අප අරමුණු කර ගත් සියලු සේවාවන් සාර්ථකව ඉටුකිරීම සඳහා අපට ආශිර්වාද කළ දෙවිඳුන්ටත් අප සභා පාලක දේවගැතිතුමා ඇතුළු සහය වූ සැමටත් ස්තූති කරමු.

**දර්ශන මාවල**
**ලේකම්**

## සභාවේ කෘතඥතාවය

2023 වසර මුළුල්ලේ තම බැටළු රැළ පෝෂණය කරමින් රැකබලා ගත් සභාවේ එඬේරා වූ ගරු ශ්‍රියාන් ජයමාන්න දේවගැතිතුමාගේ සේවයට සභාවේ කෘතඥතාවය පුද කරමු. සභාව ආත්මිකව පෝෂණය කරමින් රෝගීන් බැලීමට යමින් යාඥාව තුළින් ඔවුන් ශක්තිමත් කරමින් එතුමා ඉටු කළ සේවය අගය කරමු. සභාවේ අනු අංශයන්හි සේවය සඳහා එතුමාගෙන් ලැබුණු මඟ පෙන්වීම විශේෂයෙන් සිහිපත් කළ යුතුය.

එතුමාගේ සේවයට ශක්තියක් වෙමින් ශ්‍යාමා ජයමාන්න මහත්මිය ඉටු කළ සේවය අමතක කළ නොහැක. විශේෂයෙන් ඉරිදා පාසල් දරුවන්

වෙනුවෙන් ඇගෙන් ඉටු වූ අනගි සේවය සිහිපත් කරන්නේ ගෞරවයෙනි. කාන්තා සමිතියේ අනුශාසක ධුරය දරමින් ඇය එම සමිතියේ ප්‍රගතිය සඳහා මහත් මෙහෙවරක් ඉටු කළාය.

2023 වසර තුළ අප සභාව ලැබුවා වූ සියලු ආශිර්වාදයන් ගැන දෙවියන්වහන්සේට තුති පුදමු.

තවද මේ වසර තුළ අප සභාව සමග සමීප සබඳතාවයක් දක්වමින්, දේව වචනයෙන් අප පෝෂණය කළාවූ ගරු ලූෂන් ඇන්තනී දේවගැතිතුමාගේ සේවය අගය කරමු. විශේෂ ඉරු දිනයන්හි අප දේවස්ථානයට පැමිණ දේව පණිවිඩය බෙදා දෙමින් අප ආත්මිකව ශක්තිමත් කළා වූ ගරු ජයනාත් පණ්ඩිතරත්න ගරු ශාමල් ප්‍රනාන්දු යන දේවගැතිතුමන්ලාට ද ගරු ප්‍රසාද් පෙරේරා සහෝදරතුමාට ද අපගේ කෘතඥතාවය පුද කරමු.

වෛද්‍ය ලලින් ප්‍රනාන්දු, ඩිල්රුක්ෂි නානායක්කාර, වෛද්‍ය වික්‍රම් සුදසිංහ, වෛද්‍ය අජිත් වික්‍රමසිංහ, අභිෂේක් විතානගේ සහ සුමිත් රණසිංහ යන දේශක මහත්ම මහත්මීන්ට සභාව ආත්මිකව පෝෂණය කිරීම ගැන ස්තූති කරමු. අනු අංශ ඉරු දිනයන්හි දේව පණිවිඩය බෙදා දුන් ශානිකා කමන්ති, ගිම්හානි විජේසිංහ, හිරණ්‍යා ප්‍රනාන්දු, සුසිත් ද සිල්වා යන සහෝදර සහෝදරියන් ගැන දෙවියන්වහන්සේට ස්තූති කරමු.

## ස්තූති කිරීම්

- සභාවේ මූල්‍යමය කටයුතු විගණනය කරමින් අපට සහය වන යොහාන් පෙරේරා මහතාට.
- සභාවේ එකිනෙක අංශයන්හි ආදායම් වියදම් විගණනය කරමින් අදාළ උපදෙස් දෙන නිලධාරීන්ට.
- බයිබල් අධ්‍යනයන් මෙහෙයවමින් සහා සාමාජික සාමාජිකාවන් ඇදහිල්ලේ ශක්තිමත් කරමින් ක්‍රියාකරන වෛද්‍ය ලලින් ප්‍රනාන්දු, එමානුවෙල් ගුණරත්නම්, දිලීප ප්‍රනාන්දු, අජිත් ක්‍රිස්ටෝපර් යන මහතුන් හට.
- සභාවේ නිලධාරීන්ට සහ සභා කමිටුවට.

- ✧ ගීතිකා කණ්ඩායම මෙහෙයවන ෂෙහානිකා විජේසිංහ සහෝදරියට.
- ✧ සංගීත භාණ්ඩ වාදනයෙන් සහභාගී වන සාමාජික සාමාජිකාවන්ට සහ දරු දැරියන්ට.
- ✧ දේව මාළිගාව අලංකාර කිරීම සඳහා මල් සැකසුම් සකස් කරන සුගන්තා ගුණරත්නම්, චිත්‍රා සමරසිංහ සහ රුෂිකා ජයසූරිය සහෝදරියන්ට.
- ✧ දෙව් ආසිරි සෙවනෙහි පැවැත්වෙන ඉංග්‍රීසි ඉගැන්වීමෙහි සහ සාක්ෂරතා පන්තියේ උගන්වන මිහිරන්සි සමරසිංහ, රේණුකාද සිල්වා ප්‍රමුඛ ගුරු මහත්ම මහත්මීන්ට.
- ✧ අනු අංශයන්හි සහ වෙනත් විශේෂ සේවාවන්හි යෙදෙන සාමාජිකයින්ට.
- ✧ සභාවේ දේපළ සහ ගොඩනැගිලි පිළිබඳ වගකීමෙන් කටයුතු කරන ඩිල්හාන් විජේසිංහ මහතාට.
- ✧ දේවස්ථානය දෙව් ආසිරි සෙවන ගොඩනැගිලි සහ අවට භූමිය පවිත්‍රව තබා ගැනීම සඳහා වෙහෙස වන ඩේවිඩ් මහතාට.
- ✧ සභාවට අයත් සුසාන භූමිය අලංකාරව සහ පවිත්‍රව තබා ගැනීම සඳහා වෙහෙස වන සභා සාමාජිකයන්ට සහ බාල ක්‍රිශ්ණන් මහතාට

ඔබ සියලු දෙනාටම ස්තුති කරන අතර ඉදිරි වසර සඳහා දේවාශිර්වාද පතමු.

# 2023 වසර තුළ සභාවේ සේවය කළ නිලධාරීන් සහ කමිටු සාමාජිකයින්

## නිලධාරීන්-

| | | |
|---|---|---|
| සභා පාලක | - | ගරු ශ්‍රියාන් ජයමාන්න දේවගැතිතුමා |
| ගරු ලේකම් | - | සම්පත් විජේසිංහ මහතා |
| ගරු භාණ්ඩාගාරික | - | ප්‍රසාදිනි වෙල්ගම මහත්මිය |
| උපස්ථායක මණ්ඩලය | - | රංජිත් සුදසිංහ මහතා |
| | - | දේවදාස් මාරිමුත්තු මහතා |
| | - | චිත්‍රා සමරසිංහ මහත්මිය |
| | - | ශ්‍යාමලී  අපොන්සු මහත්මිය |
| | - | රුත් විජේසිංහ මහත්මිය |
| උපලේකම් | - | ලලිත් වනිගසේකර මහතා |
| උප භාණ්ඩාගාරික | - | විදුල වනිගසේකර මහතා |
| කමිටු සාමාජිකයින් | - | ගාමිණී සමරසිංහ මහතා |
| | - | ස්ටැන්ලි විජේසිංහ මහතා |
| | - | එන්. කුමාරවේල් මහතා |
| | - | ගිහාන් සමරසිංහ මහතා |
| | - | අශාන් ද අල්විස් මහතා |
| | - | දිනේෂ් කුමාර් මහතා |
| | - | සිරිපති විජේසිංහ මහතා |
| | - | සුරංගි ලක්මාලි මහත්මිය |

## අනු අංශ නියෝජිතයින්-

| | | |
|---|---|---|
| ඉරිදා පාසල | - | ශ්‍යාමා ජයමාන්න මහත්මිය |
| කාන්තා සමිතිය | - | නිර්මලා කුමාරවේල් මහත්මිය |
| තරුණ සමිතිය | - | නවිදි වනිගසේකර මෙනවිය |
| සහෝදර සමිතිය | - | ආනන්ද කුමාර මහතා |
| දේපළ භාරකරු | - | ඩිල්හාන් විජේසිංහ මහතා |

ගීතිකා කණ්ඩායම - ෂෙහානිකා විජේසිංහ මහත්මිය
ජයසිංහ විශ්‍රාමික නිවස - රංජනී සේනාරත්න මහත්මිය
දෙව් ආසිරි සෙවන - දර්ශන මාවල මහතා

## 2023/24 වසර සඳහා ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමයේ කමිටුවල සේවය සඳහා තේරී පත් වූ අප සභා සාමාජික සාමාජිකාවන්

ගරු භාණ්ඩාගාරික ධූරය සඳහා මලිත් වනිගසේකර මහතා තේරී පත්විය.

## අනු අංශ කමිටු

### බැප්ටිස්ට් සහෝදරත්වය

සම්පත් විජේසිංහ මහතා - කමිටු සාමාජික
අජිත් අපොන්සු මහතා - ජ්‍යෙෂ්ඨ සාමාජික

### බැප්ටිස්ට් කාන්තා සංගමය

නිර්මලා කුමාරවේල් මහත්මිය - කමිටු සාමාජික

### බැප්ටිස්ට් තරුණ සංගමය

අශේන් විජේසිංහ මහතා - උපසභාපති
ගිම්හානි විජේසිංහ මහත්මිය උපලේකම්
නවිදි වනිගසේකර මෙනෙවිය - කමිටු සාමාජිකා

### සබත් පාසල් කමිටුව

දීප්ති මෙන්ඩිස් මහත්මිය

“මක්නිසාද නුඹලාගේ වැඩයද,
නුඹලා ශුද්ධවන්තයන්ට කළාවූ,
කරන්නාවූ, උපස්ථානයෙන් දෙවියන්
වහන්සේගේ නාමයට පෙන්වූ ප්‍රේමය
මතක නැති කරන්ට උන්වහන්සේ
අධර්මිෂ්ඨ නැත”

හෙබ්‍රෙව් **6:10**

**“God is not unjust, He will not forget your work and the love you have shown him as you have helped his people and continue to help them”**

**Hebrew 6:10**